# <u>සාමාන්‍ය තොරතුරු තාක්ෂණය - 1 ඒකකය</u>

1.පහත උපාංග අතරින් ආදාන හා ප්‍රතිදාන යන දෙවර්ගය සඳහාම භාවිතා කළ හැකි උපාංගය වන්නේ,

1.මුද්‍රණ යන්ත්‍රය (Printer)
2.යතුරු පුවරුව (Key Board)
3.ස්පර්ශ සංවේදී තිරය (Touch Screen)
4.බහු මාධ්‍ය ප්‍රක්ෂේපකය (Multi Media Projector)

2.පහත උපාංග අතරින් චුම්භක මාධ්‍ය ආචයන උපාංග පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,

1.සංයුක්ත තැටි(CD),සංඛ්‍යාංක බහු විධ තැටිය (DVD)
2.බ්ලූ රේ තැටි(Blue Ray),සැනෙලි මතකය (Flash Drive)
3.දෘඩ තැටිය(Hard Disk),සංයුක්ත තැටි (CD)
4.දෘඩ තැටිය (Hard Disk),චුම්භක පටිය (Magnetic Tape)

3.පරිගණකයක්,......A........,.......B......,දෘඩාංග හා පරිශීලකයා යන අංගවලින් සමන්විත වේ.පරිශීලකයාට .....C..... මගින් අතුරු මුහුණතක් ලබා දේ. A,B සහ C හිස්තැන්වලට සුදුසු පද තෝරන්න.

1.A - දෘඩාංග ,B - ස්ථිරාංග ,C - මෙහෙයුම් පද්ධතිය
2.A - ස්ථිරාංග ,B - මෘදුකාංග ,C - මෙහෙයුම් පද්ධතිය
3.A - ස්ථිරාංග ,B - මෘදුකාංග ,C - වදන් සැකසුම් මෘදුකාංග
4.A - භාෂා පරිවර්තක ,B - දෘඩාංග ,C - මෙහෙයුම් පද්ධතිය

4.Nexus සමාගමේ වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීමක් සඳහා අවශ්‍ය කරන වාර්තාවක් සම්බන්ධයෙන් පහත අවස්ථා සලකා බලන්න.ඒ ඇසුරෙන් නිවැරදි දත්තය,ක්‍රියාවලිය සහ තොරතුර තෝරන්න.

a –ව්‍යාපාරයේ එක් එක් මාසවල උපයාගත් ලාභ ප්‍රමාණ ලබා ගැනීම.
b -වාර්ෂික ලාභ විශ්ලේෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම.
c -එක් එක් මාසයේ ව්‍යාපාරය ලබා ඇති ලාභය විශ්ලේෂණය

1.a - දත්ත , b - ක්‍රියාවලිය , c - තොරතුරු
2.a - තොරතුරු ,b - දත්ත , c - ක්‍රියාවලිය
3.a - දත්ත ,b - තොරතුරු , c - ක්‍රියාවලිය
4.a - දත්ත , b - ක්‍රියාවලිය , c - ආචයනය

5.නශ්‍ය මතකයක් නොවන්නේ,

1.වාරක මතකය (Cache Memory)
2.මතක කාඩ්පත් (Memory Cards)

3.සසම්භාවී පිවිසුම් මතකය (RAM)
4.මතක රෙජිස්තර (Memory Registers)

6.දත්ත (Data) වල ස්වභාවය අනුව සත්‍ය නොවනුයේ,

1.දත්ත එක්රැස් කරගෙන ගබඩා කළ හැකිය.
2.දත්ත ගබඩා කර ඇති මාධ්‍යයකින් නැවත ලබා ගත හැකිය.
3.දත්ත සන්නිවේදනය කළ හැකිය.
4.සැකසීම කළ නොහැකිය.

7.තොරතුරුවල වටිනාකම කාලයත් සමඟ,

1.වැඩි වේ.
2.අඩු වේ.
3.සමාන වේ.
4.ශුන්‍ය වේ.

8.පද්ධති මෘදුකාංග පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,


A - Ubuntu සහ Mac පද්ධති මෘදුකාංග දෙකකි.
B - දෘඩාංග ඒකාබද්ධ කිරීම,කළමනාකරණය කිරීම මෙහි වගකීම වේ.
C - දෘඩාංග හා යෙදුම් මෘදුකාංග අතර අන්තර් ක්‍රියා කිරීමට උපකාරී වේ.

1. A හා B පමණි.
2. B හා C පමණි.
3. A හා C පමණි.
4. ඉහත සියල්ලම

9. පහත ඒවායින් කුමක් පුද්ගල පරිගණකයක සසම්භාවී ප්‍රවේශ මතකයේ සාමාන්‍ය කාර්යයක් නොවේද?

1.සකස් කර ප්‍රතිදානය කිරීමට අවශ්‍ය තොරතුරු රඳවා තබා ගැනීම.
2.සකස් කිරීමට අවශ්‍ය දත්ත හා උපදෙස් රඳවා තබා ගැනීම.
3.පරිගණකය ක්‍රියාත්මක කිරීමට (Boot – up) සහාය දෙන වැඩසටහන් රඳවා තබා ගැනීම.
4.මෙහෙයුම් පද්ධතියේ මෙහෙයවීමට අදාළ ඉඩ පහසුකම් සැපයීම.

10.මෙම රූප සටහනින් දැක්වෙන කෙවෙනි (Ports) වර්ගය වන්නේ,

.

1.RJ 45 කෙවෙනිය.
2.PS/2 කෙවෙනිය.
3.වීඩියෝ කෙවෙනිය.
4.සමාන්තර කෙවෙනිය.

## <u>පිළිතුරු</u>

| | |
|---|---|
| **1.)** 3 | 6.)4 |
| **2.)** 4 | 7.)2 |
| **3.)** 2 | 8.)4 |
| **4.)** 3 | 9.)3 |
| **5.)** 2 | 10.)1 |

**සකස් කළේ,**
**පබා පතිරණ මිය,**
**ර/ගැටහැත්ත අනුර විද්‍යාලය.**